| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 10 ශ්‍රේණිය | **කතෝලික ධර්මය** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

- **1 - 40 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරාන්න.**

1. ශුද්ධ බයිබලය ලේඛනගත වී ඇති කාලවකවානුව වන්නේ,
   i. ක්‍රි. පූ. 95 - ක්‍රි. ව. 100 අතර කාලය තුළදීය
   ii. ක්‍රි. පූ. 950 - ක්‍රි. ව. 1000 අතර කාලය තුළදීය
   iii. ක්‍රි. පූ. 950 - ක්‍රි. ව. 100 අතර කාලය තුළදීය
   iv. ක්‍රි. පූ. 950 - ක්‍රි. පූ. 100 අතර කාලය තුළදීය

2. "මේ පොතෙහි ලියා නැති වෙනත් බොහෝ හාස්කම් ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් ඉදිරියෙහි සිදු කළ සේක" මෙලෙස සඳහන් කර ඇත්තේ,
   i. ශු. ජොහාන් ශුභාරංචියේ ය
   ii. ශු. මතෙව් ශුභාරංචියේ ය
   iii. ශු. මාක් ශුභාරංචියේ ය
   iv. ශු. කොරින්ති ලිපියේ ය

3. ලේඛනගත වී නැති ජේසුස් වහන්සේ කළ කී දේවල් ශුද්ධ වූ සභාමාතාව අපට දායාද කරනුයේ,
   i. වාචික සම්ප්‍රදාය මඟිනි
   ii. ජීවන සහා සම්ප්‍රදාය මඟිනි
   iii. මහෝපදේශය මඟිනි
   iv. සභා නීති සංග්‍රහය මඟිනි

4. ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පරිපූර්ණ වූ අපෝස්තුලුවරු සුබ අස්න දේශනා කිරීම ආරම්භ කරනු ලැබුයේ,
   i. ජෙරුසෙලමෙන් හා ජුදයාවෙනි
   ii. සමාරියෙනි
   iii. ගලීලයෙනි
   iv. ගලීලයෙන් හා ජෙරුසලමෙනි

5. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි සැකැස්මේ අන්තර්ගත කරුණක් නොවන්නේ,
   i. ධර්මදූත සේවයට සූදානම
   ii. ජෙරුසලමෙහි සාක්ෂි දැරීම
   iii. ශු. පාවුලු තුමාගේ ධර්මදූත සේවය
   iv. ගලීලයේ සිට ජෙරුසලම දක්වා ගමන

6. ක්‍රිස්තු භක්තිකයන් විශ්වාසයේ ස්ථිරව සිටින ලෙස දන්වමින් පාවුලුතුමා විසින් ලියන ලද ලිපිය වන්නේ,
   i. පිලිප්පි
   ii. පිලමොන්
   iii. කොලොස්සි
   iv. රෝම

7. වෙනත් හසුන් ලිවීමට දායක වී ඇති අපෝස්තුලුවරුන් වන්නේ,
   i. පේදුරු, ජොහාන්, ඇන්ඩෘ හා පිලිප් ය
   ii. ජොහාන්, ජාකොබ්, ඇන්ඩෘ හා පිලිප් ය
   iii. පේදුරු, ජොහාන්, ජුද් හා ජාකොබ් ය
   iv. ජොහාන්, පිලිප්, ජුද් හා ජාකොබ් ය

8. පීඩාකාරී බලය නියත ලෙස පරාජය වන බව පෙන්වාදෙන එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණය කුමක්ද?
   i. ද්විත්වවාදය
   ii. යුගාන්තවාදය
   iii. ආරූඪ කතෘත්වය
   iv. සංකේත භාවිතය

9. 'එළිදරව්ව' ග්‍රන්ථය ලියැවී ඇත්තේ කුමන අධිරාජ්‍යයාගේ කාලයේදීද?
   i. ඩොමීෂියන්
   ii. නීරෝ
   iii. සිරියානු
   iv. රෝම

10. යහපතින් අයහපත වෙන්කර හඳුනාගෙන යහපත කිරීම ………….. යි. මෙහි හිස්තැනට සුදුසු වචනය වනුයේ,
   i. දැනගැනීම
   ii. ධෛර්යය
   iii. ප්‍රඥාව
   iv. මර්යාදාව

11. ''නුඹට සමාන කෙනෙකු නුඹට පළමුවෙන් සිටියේවත් නුඹට පසුව සිටින්නේවත් නැතිවන ලෙස තියුණු නැණ නුවණ නුඹට දෙමි.'' මෙලෙස පැවසූයේ කාහටද?
   i. දාවිත් රජතුමාට
   ii. සාවුල් රජතුමාට
   iii. සාමුවෙල්ට
   iv. සලමොන් රජතුමාට

12. ප්‍රඥාව සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ,
   i. හොක්මා ය
   ii. නෙව්මා ය
   iii. ඇපොකලිප්ස් ය
   iv. බසාර් ය

13. පේදුරුතුමා තෙවරක් ජේසුස් වහන්සේව නාඳුනන බව ප්‍රකාශ කරන ලද්දේ කොහේදීද?
   i. ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයේදී ය
   ii. උත්තම පූජකයාගේ මැදුරේදී ය
   iii. ආණ්ඩුකාර පිලාත් ඉදිරියේදී ය
   iv. හෙරෝද් ඉදිරියේදී ය

14. ජේසුස් වහන්සේ පාස්කු ඉරුදින සවස අපෝස්තුලුවරුන් වෙත වැඩම කර පැවසූයේ කුමක්ද?
   i. ඔබට ශාන්තිය වේවා!
   ii. ඔබට සාමය වේවා!
   iii. ස්වාමීන් වහන්සේ ඔබ සමඟ වේවා!
   iv. ඔබට සමාව ලැබේවා!

15. ස්වර්ගීය ජීවිතය නැමැති නව අහස හා නව පොළව සඳහා පෙර නිමිත්ත වනුයේ,
   i. ජේසුස් වහන්සේගේ දුක්විඳීමයි
   ii. ජේසුස් වහන්සේගේ උපතයි
   iii. ජේසුස් වහන්සේගේ උත්ථානයයි
   iv. ජේසුස් වහන්සේගේ උකුත්වීමයි

16. 'පෙන්තකොස්ත' යන්නෙහි අර්ථය වනුයේ,
   i. පනහ
   ii. හැත්තෑව
   iii. හැත්තෑ දෙක
   iv. පනස් හත

17. ශු. මහා ජාකොබ්තුමාව හිස ගසා මරා දමන ලද්දේ,
   i. හෙරෝද් ඇන්ටිපස් විසිනි
   ii. හෙරෝද් පිලිප් විසිනි
   iii. හෙරෝද් අග්‍රිපා විසිනි
   iv. හෙරෝද් අර්කෙලාවුස් විසිනි

18. මුල් කිතුනු සභාව තුළ සහනාධාර බෙදීම සම්බන්ධයෙන් ඇති වූ ගැටලුව නිරාකරණය කිරීමට ගනු ලැබූ පියවර වන්නේ,
   i. උපස්ථායකයින් පත් කිරීමයි
   ii. සහනාධාර බෙදාදීම නවතාලීමයි
   iii. අපෝස්තුලුවරු සහනාධාර බෙදීමට යොමුවීමයි
   iv. සහනාධාර ලබාගන්නා අය සීමා කිරීමයි

19. ශු. පාවුලුතුමා සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,
   i. ශු. පාවුලුතුමා බෙන්ජමින් ගෝත්‍රයට අයත් වූවෙකි.
   ii. එතුමා වෛද්‍යවරියෙකි.
   iii. ගමාලියෙල් යටතේ අධ්‍යාපනය ලැබුවේය.
   iv. කිතුනුවන් අත්අඩංගුවට ගැනීමට දමස්කස් නගරය කරා ගියේය.

20. දෙවන ධර්මදූත චාරිකාවේදී ශු. පාවුලුතුමා සමඟ පසුව සම්බන්ධ වූ අය කවුරුන්ද?
   i. තිමෝතියස් හා ලූක්තුමා
   ii. ලූක් තුමා හා මාක්තුමා
   iii. මාක්තුමා හා ජොහාන් තුමා
   iv. ලූක්තුමා හා සීලස්

21. ශු. පාවුලුතුමා හිස ගසා මරා දමන ලද අධිරාජ්‍යයා වන්නේ,
   i. ඩොමිෂියන්
   ii. දියෝක්ලේසියානු
   iii. ට්‍රාජන්
   iv. නීරෝ

22. ජේසුස් වහන්සේ 'ඔබ ඉතා භාග්‍යවන්තය' යි පවසන ලද්දේ,
   i. ශු. පාවුළුතුමාටය
   ii. ශු. පේදුරුතුමාටය
   iii. ශු. ලූක්තුමාටය
   iv. ශු. ජොහාන්තුමාටය

23. අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා කතෝලික සභාවේ කීවෙනි ශුද්ධෝත්තම පියතුමාද?
   i. 266
   ii. 267
   iii. 263
   iv. 264

24. පේදුරුතුමා ජේසුස් වහන්සේ වෙත තමා තුළ වූ ප්‍රේමය කීවරක් ස්ථිර ලෙස ප්‍රකාශ කරනු ලැබුවේද?
   i. දෙවරක්
   ii. තෙවරක්
   iii. සත්වරක්
   iv. පස්වරක්

25. 'එක ජාතියකට, එක දේශයකට, එක ප්‍රදේශයකට සීමා වී නැත' මෙලෙස විස්තර කෙරෙන ශු. සභාවේ ලක්ෂණය කුමක්ද?
   i. ශුද්ධත්වය
   ii. ඒකත්වය
   iii. කතෝලිකත්වය
   iv. අපෝස්තලිකත්වය

26. ජේසුස් වහන්සේ ශුද්ධ වූ සභාවේ එකමුතුකම වෙනුවෙන් යාච්ඤා කළ ආකාරය දැක්වෙන්නේ,
   i. මතෙව් ශුභාරංචියේ ය
   ii. මාක් ශුභාරංචියේ ය
   iii. ලූක් ශුභාරංචියේ ය
   iv. ජොහාන් ශුභාරංචියේ ය

27. ශුද්ධ වූ සභාවේ ශුද්ධවත් වනුයේ,
   i. ශු. ත්‍රිත්වයට ඇති සබඳතාවය මතය
   ii. ශු. සභාවේ විශ්වීය බව මතය
   iii. ජේසුස් වහන්සේගේ බලය මතය
   iv. මිනිසාගේ කැපවීම මතය

28. 'ඔබ ජෙරුසලමෙහි ද, මුළු ................ ද පොළවේ සීමාන්තයන් දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නාහුය' මෙම ශු. ලියවිලි පාඨයේ හිස්තැනට සුදුසු පිළිතුර වනුයේ,
   i. ගලීලයෝ
   ii. ජුදයේ
   iii. සමාරියෙහිද
   iv. ජුදයෙහි හා සමාරියෙහි

29. පෘතුගීසීන් ලංකාවට පැමිණියේ,
   i. 1687 දීය
   ii. 1505 දීය
   iii. 1948 දීය
   iv. 1796 දීය

30. ලන්දේසී පාලන සමයේදී කතෝලික ජනතාව මුහුණදුන් ප්‍රධානතම ගැටලුව වූයේ,
   i. දෙව්මැදුරු රෙපරමාදු පූජකයින් පවරාගැනීම.
   ii. දරුවන් පාසල් නොයවන දෙමාපියන්ට දඩ නියම කිරීම
   iii. පූජකයෙක් නොමැතිවීම
   iv. පාසල්වල රෙපරමාදු දහම පමණක් ඉගැන්වීම

31. ප්‍රථම වරට පූප හා මිදියුෂ ගෙන දෙවියන් වහන්සේට ඔප්පු කරනු ලැබුවේ,
   i. මෙල්කිසදෙක්
   ii. මෝසෙස්
   iii. දාවිත්
   iv. සලමොන්

32. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම වෙනුවට සුවිශේෂක ජොහාන්තුමා පෙන්වා දෙන සිද්ධිය කුමක්ද?
   i. කන්ද උඩ දේශනය
   ii. පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යය
   iii. කානා නුවර වතුර වයින් කිරීම
   iv. ශ්‍රාවකයන්ගේ පාද සේදීම

33. පුරාණ ගිවිසුමේ ජනවන්දනාවේ කේන්ද්‍රීය ක්‍රියාව වනුයේ,
   i. දිව්‍ය පූජාව පැවැත්වීමයි
   ii. යාග පූජා පුද කිරීමයි
   iii. පාප වලට වන්දි ගෙවීමයි
   iv. පව්සමාව ලබා ගැනීමයි

34. සිරගෙදරදී විෂ ශරීරගත කොට මරණයට පත්කරනු ලැබුයේ,
   i. ශු. මැක්සිමිලියන් කෝල්බෙ මුනිතුමා
   ii. ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා
   iii. භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය
   iv. ශු. ජුසේවාස් මුනිතුමා

35. භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය විසින් 1948 අගෝස්තු 17 වන දින ආරම්භ කරන ලද පැවිදි නිකාය වන්නේ,
   i. දයාවේ දූතිකාවෝ
   ii. සුරදූත නිකාය
   iii. දොමිනිකාන පැවිදි සොයුරියෝ
   iv. සිරිකුරුස පැවිදි නිකාය

36. 'ධනය, බලය, කීර්තිය පසුපස හඹා යාම' කිනම් පනතට විරුද්ධ ක්‍රියාවක්ද?
   i. දෙවන පනතට
   ii. තෙවන පනතට
   iii. දසවන පනතට
   iv. පළමු පනතට

37. ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීම සඳහා අප විසින් කළ යුතු පළමු ණය යුතුකම වන්නේ,
   i. යාච්ඤා කිරීමයි
   ii. දිව්‍ය පූජාවට සහභාගී වීම
   iii. සමිති සමාගම්වලට සහභාගී වීම
   iv. රෝගීන් බලන්නට යාමයි

38. 'නිමල් දහම් පාසලේ ගුරුතුමියට අවනත නොවී ඇයට බැණවැදී ඇත' නිමල් විසින් කඩකරන ලද දේව පනත වනුයේ,
   i. පළමු පනත
   ii. දෙවන පනත
   iii. තෙවන පනත
   iv. සිව්වන පනත

39. හතරවන පනතට විරුද්ධ ක්‍රියාවකි.
   i. බොරු කීම
   ii. නියමිත ලෙස බදු නොගෙවීම
   iii. පුද්ගල නිදහසට ගරු කිරීම
   iv. බාර ඔප්පු නොකිරීම

40. 'නුඹේ පියාට ද මවට ද ගෞරව කරන්න. එවිට නුඹේ දෙවි සමිදාණන් වහන්සේ නුඹට දෙන රටේ නුඹ බොහෝ කාලයක් ජීවත් වන්නෙහිය' මෙලෙස සඳහන් වනුයේ,
   i. එපීස ග්‍රන්ථයේය
   ii. නික්මයාම ග්‍රන්ථයේය
   iii. හෙබ්‍රෙව් ග්‍රන්ථයේය
   iv. ජොහාන් සුභාරංචියේය

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

1.

i. දේව අනාවරණයේ මූලාශ්‍ර 02 ලියන්න.

ii. ද්විතීය පාවුලු සංදේශ 02ක් ලියන්න.

iii. එළිදරව්වාදී ග්‍රන්ථ ලියවී ඇති කාලවකවානු ලියා දක්වන්න.

iv. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද 02ක් ලියන්න.

v. ජුදයින් අතට පාවාදීමෙන් අනතුරුව ජේසුස් වහන්සේව රැගෙන ගිය ස්ථාන 02ක් ලියන්න.

vi. ජේසුස් වහන්සේ උකුත් වූ අවස්ථාවේ සිදු වූ සිදුවීම් 02ක් ලියන්න.

vii. මුල් කිතුනු සභාවේ ලක්ෂණ 02ක් ලියන්න.

viii. ශු. සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගීවරයා හා අපෝස්තුලුවරුන් අතර පළමු ප්‍රාණ පරිත්‍යාගීවරයා ලියා දක්වන්න.

ix. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට සූදානම් විය යුතු ආකාර 02ක් ලියන්න.

x. බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් 02ක් ලියන්න.

(ලකුණු 2×10=20)

2.

i. පාවුලුතුමා විසින්ම රචිත කෘති 02ක් ලියන්න.

ii. ශු. පාවුලුතුමා පිළිබඳ කරුණු 03ක් ලියන්න.

iii. ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ තම හැකියාවන් දේව සේවය උදෙසා යෙදවිය හැකි ආකාර පහක් ලියා විස්තර කරන්න.

3.

i. ශ්‍රී ලංකා ශු. සභා ඉතිහාසය බෙදෙන ප්‍රධාන යුග 02ක් ලියන්න.

ii. පෘතුගීසි පාලන සමයේ මෙරටට පැමිණි ධර්මදූත කණ්ඩායම් 03ක් ලියන්න.

iii. ශ්‍රී ලාංකීය කිතුනු සභාවේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් යොවුන් වියේ සිටින ඔබට කළ හැකි යෝජනා 05ක් ලියා විස්තර කරන්න.

4.

i. මහ ප්‍රහස්පතින්දා දිනයේ සිදු වූ විශේෂ සිදුවීම් 02ක් ලියන්න.

ii. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ 03ක් ලියන්න.

iii. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගීවන්නකු ලෙස ඔබ තුළ තතිබිය යුතු ගුණාංග 05ක් ලියා විස්තර කරන්න.

5.

i. ඊශ්‍රායලයේ පූජා බෙදෙන ප්‍රධාන කොටස් 02ක ලියන්න.

ii. දවන පූජා ප්‍රධාන වර්ග 03ක් ලියන්න.

iii. 'අප ජීවිතය දෙවිඳුන්ට පිදෙන යාගයක් බවට පත්කර ගනිමු' මාතෘකාව ඔස්සේ පුවත්පතකට ලිපියක් ලියන්න.

6.

i. පළමු පනතට විරුද්ධ ක්‍රියා 02ක් ලියන්න.

ii. දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු 03ක් ලියන්න.

iii. ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීමට කළ හැකි දේවල් 05ක් විස්තරාත්මකව ලියා දක්වන්න.

7. පහත මාතෘකා අතරින් 02ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. පළමු දේව පනත

ii. ජුසේවාස් මුනිතුමා

iii. යාචිඤාවේ ජීවිතය

iv. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සූදානම